පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

# පළමු වාර පරීක්ෂණය - 2023

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II

11 ශ්‍රේණිය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

*සැලකිය යුතුයි*

**සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **පහත සඳහන් සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 01 සිට 04 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

අජන්ත නැමති පුද්ගලයෙකු උසස් පෙළ විභාගයෙන් පසු ඉවතලන දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව තමාගේ පියා වඩු කාර්මිකයෙකු නිසා ඔහුගේ ආභාෂයෙන් ලද කැටයම් කැපීමේ ශිල්පය උපයෝගී කරගෙන ප්‍රදේශයෙන්ම පොල් කටු ලබාගෙන පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් 'මිහිසරු' නමින් පවත්වාගෙන යයි.

01) මෙම සිද්ධියේ සඳහන් ''මිහිසරු'' නිෂ්පාදන ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද ?

(1) අධ්‍යාපනය (2) විනෝදය (3) ආහාර (4) ඇඳුම්

02) මෙම සිද්ධියේ සඳහන් ''මිහිසරු'' නිෂ්පාදන ආයතනය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) හවුල් ව්‍යාපාර (2) තනි පුද්ගල ව්‍යාපාර

(3) සංස්ථාපිත සමාගම් (4) සමිති සමාගම්

03) විසිතුරු භාණ්ඩ නිෂ්පාදනට භාවිතා කරන පොල්කටු අයත් වන නිෂ්පාදන සාධකය වනුයේ,

(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසාය

04) ඉහත සිද්ධියේ සඳහන් ''මිහිසරු'' නිෂ්පාදන ව්‍යාපාරයට සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.

(2) මෙම ව්‍යාපාරය සම්බන්ධව අජන්තගේ වගකීම සීමිතය.

(3) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.

(4) මෙම ව්‍යාපාරය සම්බන්ධව තනි තීරණ ගත නොහැකිය.

05) ව්‍යාපාරයකට තර්ජනයක් වන්නේ මින් කවරක් ද ?

(1) පුහුණු සේවකයන්ගේ හිඟය

(2) නව තාක්ෂණික ක්‍රමවලට අනුගත වීමේ නොහැකියාව

(3) අයහපත් සේවක ආකල්ප

(4) භූගෝලීය පිහිටීම නුසුදුසු වීම.

06) ව්‍යාපාර පරිසරයේ සිදු වූ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.

A - මාර්ග පහසුකම් දියුණු කිරීම.

B - ණය සඳහා පොලී අනුපාතය ඉහළ යාම.

C - බදු ප්‍රතිපත්ති ගෙන ඒම.

ඉහත සිදුවීම් අතුරින් දේශපාලන පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A හා B (2) B හා C (3) A හා C (4) A,B හා C ය

07) විමලාගේ මල් ව්‍යාපාරය 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ 'සුපිපි මල්' නමින් ලියාපදිංචි කරන ලදී. ඉන් ඇගේ ව්‍යාපාරයට ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ,

(1) ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් හිමි වීම.

(2) ආදායම් බද්දෙන් නිදහස් විය හැකි වීම.

(3) ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම.

(4) වගකීම් යෙදූ ප්‍රාග්ධනයට පමණක් සීමා කරගත හැකි වීම.

08) සිල්ලර වෙළෙඳාමේ නිරත ව්‍යාපාරවල ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද ?

(1) අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩ විකිණීම (2) භාණ්ඩ වර්ග රාශියක් ඉදිරිපත් කිරීම

(3) සාපේක්ෂව විකුණුම් මිල අඩු වීම (4) පාරිභෝගිකයාට සමීප වීම

09) පහත දී ඇත්තේ විද්‍යුත් මුදල් වර්ග කිහිපයකි.

A - සී බැන්ක් වීසා B - කැට් සුපර් C - පීපල්ස් වීසා

මේවා අතුරින් ණයපත් ලෙස සැලකිය හැක්කේ,

(1) A හා B (2) B හා C (3) A හා C (4) A,B හා C ය

10) රු. ලක්ෂ 30ක් වටිනා අනුර සතු මෝටර් රථය එම මුදලටම රක්ෂණය කර තිබුණි. හදිසි අනතුරකින් මොටර් රථයට රු. ලක්ෂ 6ක හානියක් සිදු වී ඇත. අදාල රක්ෂණ සමාගමෙන් අනුරට රක්ෂණ වන්දි ලෙස රු. ලක්ෂ 06ක් ලැබුණි.

මෙයට අදාළ රක්ෂණ මූලධර්මය වන්නේ,

(1) උපරිම විශ්වාසය (2) රක්ෂණ හිමිකම

(3) ආසන්නතම හේතුව (4) හානි පූර්ණය

11) සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A - දුරකථන B - SMS C - විද්‍යුත් තැපෑල D - ස්කයිප්

ඉහත සන්නිවේදන ක්‍රම අතුරින් විද්‍යුත් හා වාචික සන්නිවේදන මාධ්‍යයට වැටෙන්නේ,

(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

12) ප්‍රවාහන ......1...... මඟින් වරකට ගෙන යා හැකි භාණ්ඩ ප්‍රමාණය ......2...... නම් වේ.

ඉහත ප්‍රකාශයේ 1 හා 2 ස්ථානවලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) මාධ්‍යය, ධාරිතාව (2) පර්යන්තර, සුලබතාව

(3) මාර්ගය, ධාරිතාව (4) බලය, පිරිවැය

13) පහත දැක්වෙන්නේ තෝපාව මහා විද්‍යාලයේ වාර්ෂික වාණිජ දිනය පැවැත්වීම සඳහා අනුගමනය කරන ලද පියවරයන් කිහිපයකි.

1 - වාණිජ දිනය සඳහා තේමාවක් තීරණය කිරීම.

2 - මුදල් හා සම්පත් ඒ ඒ කමිටු සඳහා වෙන් කිරීම.

3 - වාණිජ දිනය අවසානයේ දී එහි සාර්ථකත්වයට බලපෑ කරුණු පිළිබඳ වාර්තාවක් සැකසීම.

4 - කමිටු නායකයන් විසින් තම සාමාජිකයන් අදාල කාර්යයේ නිරත කරවීම.

ඉහත පියවරයන් කළමනාකරණ මූලිකාංග සමග සම්බන්ධ කල විට නිවැරදි පිළිතුර තෝරන්න.

(1) සැලසුම්කරණය, සංවිධානකරණය, පාලනය, මෙහෙයවීම

(2) සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම, පාලනය

(3) සංවිධානකරණය, මෙහෙයවීම, පාලනය, සැලසුම්කරණය

(4) සංවිධානකරණය, සැලසුම්කරණය, මෙහෙයවීම, පාලනය

14) A - ගුණත්වය E - පිහිටීම

B - වට්ටම් F - ප්‍රවාහනය

C - බෙදාහැරීම G - ප්‍රචාරණය

D - දීමනා H - ගෙවීම් ක්‍රම

අලෙවිකරණයේ විචල්‍යයන්ට අයත් අයිතම ඉහත දැක් වේ. ඒ අයිතම අතරින් මිල විචල්‍යට අදාල අයිතම වන්නේ,

(1) ABC (2) DEF (3) BDH (4) FGH

15) අලෙවිකරණයට අයත් කටයුත්තක් නොවන්නේ,

(1) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කළ හැකි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම.

(2) සාධාරණ මිලක් ලකුණු කිරීම

(3) භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා වෙත බෙදා හැරීම

(4) ප්‍රචාරණ උපක්‍රම අනුගමනය කරමින් පාරිභෝගිකයා ආකර්ශණය කර ගැනීම

16) ව්‍යාපාරික අරමුණ අපේක්ෂිත ආකාරයටම ඉටුකර ගැනීම ......1...... ලෙස ද අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිත කිරීම ......2...... ලෙසද හැඳින් වේ. ඉහත ප්‍රකාශයේ 1 හා 2 පිළිවෙලින් දැක්වෙනුයේ,

(1) කාර්යක්ෂමතාව, සඵලදායිතාව (2) ඵලදායිතාව, කාර්යක්ෂමතාව

(3) කාර්යක්ෂමතාව, ඵලදායිතාව (4) සඵලදායිතාව, කාර්යක්ෂමතාව

17) ජංගම වත්කම් පමණක් අඩංගු කාණ්ඩය වන්නේ,

(1) මෝටර් රථ, තොග, ණය ගැතියෝ, බැංකු ශේෂය

(2) ලී බඩු, තොග, බැංකු ශේෂය, මුදල් ශේෂය

(3) ගොඩනැගිලි, ලී බඩු, මෝටර් රථ, පරිගණක

(4) තොග, ණයගැතියෝ, බැංකු ශේෂය, මුදල් ශේෂය

18) ණය හිමියන්ට රු. 15,000 ක් මුදලින් ගෙවීම නිසා ව්‍යාපාරයේ,

(1) වත්කම් හා වගකීම් යන දෙකම රු. 15,000 කින් අඩු වේ.

(2) වත්කම් හා වගකීම් යන දෙකම රු. 15,000 කින් වැඩි වේ.

(3) වත්කම් රු. 15,000 කින් අඩු වී, වගකීම් රු. 15,000 කින් වැඩි වේ.

(4) වත්කම් රු. 15,000 කින් වැඩි වී, වගකීම් රු. 15,000 කින් අඩු වේ.

19) ගණුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

| වත්කම් | = | අයිතිකරුගේ හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| +25 000 | = | | | + 25 000 |

ඉහත සමීකරණයේ සටහන් කර ඇති ගණුදෙනුව වන්නේ,

(1) රු. 25,000 ක බඩු තොගයක් ණයට ගැනීම

(2) ණය හිමියන්ට රු. 25,000 ක් ගෙවීම.

(3) බැංකු ණය මුදලින් රු. 25,000 ක් ආපසු ගෙවීම.

(4) අයිතිකරු මුදලින් රු. 25,000 ක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම.

20) මූලික පොතක් මෙන්ම ලෙජර ගිණුමක් ලෙස ද ද්විත්ව කාර්යයන් ඉටුකරන මූලික සටහන් පොතකි.

(1) විකුණුම් ජර්නලය (2) පොදු ජර්නලය

(3) ගැනුම් ජර්නලය (4) මුදල් පොත

21) ව්‍යාපාරයක් විසින් මසක් තුළ සිදු කළ ගණුදෙනු පිළිවෙලින් මෙසේය.

*අත්පිට විකුණුම් රු. 8,000*

*ණයට ගැණුම් රු. 6,000*

*විදුලි ගාස්තු ගෙව්වා රු. 3,200*

මෙහි දී යොදා ගත් මූලාශ්‍ර ලේඛණ පිළිවෙලින්,

(1) ඉන්වොයිසිය, ලදුපත, වවුචරය (2) ලදුපත, ඉන්වොයිසිය, වවුචරය

(3) වවුචරය, ලදුපත, ඉන්වොයිසිය (4) ලදුපත, වවුචරය, ඉන්වොයිසිය

22) දමිත්ගේ ව්‍යාපාරයේ ණය ගැතියෙකු වූ ඉමාෂගෙන් රු. 6,000ක ණය මුදලක් ලැබීමේ දී 10% ක වට්ටමක් දෙන ලදී. මෙය දමිත්ගේ ව්‍යාපාරයේ,

(1) රු. 6,000 ක ලද වට්ටමකි (2) රු. 600 ක දුන් වට්ටමකි

(3) රු. 6,000 ක දුන් වට්ටමකි (4) රු. 600 ක ලද වට්ටමකි

23) ණය හිමියන්ගෙන් ලද වට්ටම් පිළිබඳ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) ණය හිමියන්ගේ ගිණුම - හර, දුන් වට්ටම් ගිණුම - බැර

(2) ලද වට්ටම් ගිණුම - හර, ණය හිමියන්ගේ ගිණුම - බැර

(3) ණය හිමියන්ගේ ගිණුම - හර, ලද වට්ටම් ගිණුම - බැර

(4) දුන් වට්ටම් ගිණුම - හර, ණය හිමියන්ගේ ගිණුම - බැර

24) ව්‍යාපාරයේ ණයගැතියෙකු චෙක්පතකින් මුදල් ගෙවීම, සටහන් කළ යුතු මූලික පොත වනුයේ,

(1) පොදු ජ'නලය (2) මුදල් ගිණුම

(3) බැංකු ගිණුම (4) විකුණුම් ජ'නලය

25) ව්‍යාපාරයක සුළු මුදල් පොතක් සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

*2023.01.01 දිනට සුළු මුදල් භාරකරු අත ඇති මුදල - රු. 200*

*2023.01.01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම - රු. 1800*

*2023.01.31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල - රු. 300*

ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම සහ ජනවාරි මාසයේ සුළු මුදල් වියදම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 2,000 හා රු. 1,500 (2) රු. 1,800 හා රු. 1,500

(3) රු. 1,800 හා රු. 1,700 (4) රු. 2,000 හා රු. 1,700

26) ව්‍යාපාරයක බැංකු ගිණුමේ බැර ශේෂය වන්නේ,

(1) වත්කමකි (2) ආදායමකි

(3) වගකීමකි (4) හිමිකමකි

27) බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලබන්නේ,

(1) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් හා බැංකු ගාස්තු පමණි.

(2) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් පමණි.

(3) නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් හා ස්ථාවර නියෝග මත කළ ගෙවීම් පමණි.

(4) ස්ථාවර නියෝග මත කළ ගෙවීම් හා සෘජු ප්‍රේෂණ මගිනි.

28) 2023 මාර්තු මාසයේ සඳුනිගේ ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනයේ බැර ශේෂය රු. 9,000 ක් ලෙසත්, ව්‍යාපාරයේ බැංකු පොතේ හර ශේෂය රු. 10,500 ක් ලෙසත් සටහන්ව තිබුණි. මෙම වෙනසට හේතු විය හැක්කේ,

(1) ව්‍යාපාරය වෙනුවෙන් බැංකුවට සෘජුව ම ලැබුණු ලාභය

(2) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත්

(3) බැංකුවට ලැබී තිබුණු ණයගැති ප්‍රේෂණ ය

(4) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ය

29) රජරට සළුපිළි වෙළෙඳසැල විසින් පිළියෙල කළ මූලික සටහන් පොතක දිනය, ඉන්වොයිස් අංකය, ගැණුම්කරු, මුළු වටිනාකම හා ලෙජර් පිටුව යන තීරු දක්නට ලැබුණි. මෙම මූලික සටහන් පොත වන්නේ,

(1) ගැනුම් ජ'නලය (2) විකුණුම් ජ'නලය

(3) පොදු ජ'නලය (4) සුළු මුදල් පොත

30) දඹුලු ලී බඩු වෙළෙඳසැලට අමායා මොටර්ස් ආයතනයෙන් රුපියල් ලක්ෂ 45ක ලොරි රථයක් ණයට ගැනීමට අදාළ මූලාශ්‍ර ලේඛණය ......1...... වන අතර මූලික සටහන් පොත ......2...... වේ. 1 හා 2 යන ස්ථාන සඳහා නිවැරදි පිළිතුර පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) පොදු ජ'නලය, ජ'නල් වවුචරය (2) ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ජ'නලය

(3) ජ'නල් වවුචරය, පොදු ජ'නලය (4) ගැනුම් ජ'නලය, ගැනුම් ඉන්වොයිසිය

31) පහත ගණුදෙනු අතුරින් හිමිකමට බලපෑමක් ඇති නොකරන ගණුදෙනුව වන්නේ,

(1) රු. 40,000 ක් වටිනා භාණ්ඩ රු. 50,000 කට අත්පිට විකිණීම

(2) රු. 2,000 ක් අයිතිකරුගේ පෞද්ගලික විදුලි බිල, ව්‍යාපාරයේ මුදලින් ගෙවීම

(3) රු. 25,000 ක් වටිනා පරිගණකයක් අත්පිට මුදලට ගැනීම

(4) ව්‍යාපාරයේ දුරකථන ගාස්තු රු. 3,000 ක් මුදලින් ගෙවීම.

32) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක ගිණුම් කටයුතුවලදී සිදු වූ වැරදි කිහිපයකි.

A - යන්ත්‍ර අලුත්වැඩියා සඳහා වැය වූ රු. 5,000 යන්ත්‍ර ගිණුමට හර කිරීම.

B - රු. 2,100 රශ්මිකගෙන් ණයට ගැනුම් ඔහුගේ ගිණුමට රු. 4,200 ක් ලෙස සටහන් වීම.

C - රු. 5,800 ක විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් තැබීමට අතපසු වීම.

D - රු. 2,000 ක් විදුලි බිල් ගෙවීම් මුදල් ගිණුමට බැර කර වරිපනම් ගිණුමට හර කිරීම.

මෙ අතුරින් ශේෂ පිරික්සුම අසමාන වීමට බලපාන වරදක් වනුයේ,

(1) C (2) B (3) D (4) A

- *අකිදුගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 18,200 ක් වූ අතර එය බැංකු ප්‍රකාශයට අනුව ශේෂය නොගැලපුණි.*

1 - තැන්පත් කල නමුත් නිෂ්කාෂණය නොවූ චෙක්පත් රු. 4,200

2 - බැංකුව විසින් අය කල බැංකු ගාස්තු රු. 1,500

3 - බැංකුවට ලැබුණු සෘජු ප්‍රේෂණ රු. 2,000

33) සංශෝධිත මුදල් පොතට අනුව බැංකු ශේෂය,

(1) රු. 14,000 (2) රු. 20,200 (3) රු. 17,500 (4) රු. 18,700

34) බැංකු ප්‍රකාශනයේ සඳහන්ව තිබූ ශේෂය විය යුත්තේ,

(1) රු. 12,500 (2) 16,000 (3) රු. 14,500 (4) රු. 10,500

35) *අවිනිශ්චිත ගිණුම හර 4,000*

*රක්ෂණ ගාස්තු ගිණුම බැර 4,000*

ඉහත ගැලපුම් සටහන කිනම් ගිණුම්කරණ වැරැද්දක් නිවැරදි කිරීමට අවශ්‍ය වේද ?

(1) රක්ෂණ ගාස්තු ගිණුම්ගත නොවීම නිවැරදි කිරීම ය

(2) රක්ෂණ ගාස්තු ගිණුමෙහි රු. 4,000 ක් වැඩියෙන් සටහන් වීම නිවැරදි කිරීම

(3) රු. 4,000 රක්ෂණ ගිණුමට පමණක් හර වීම නිවැරදි කිරීම

(4) රක්ෂණ ගාස්තු ගිණුමෙහි රු. 4,000 අඩුවෙන් සටහන් වීම නිවැරදි කිරීම

36) ගැණුම් ජ'නලය පිළියෙල කිරීමෙන් පසු එහි අවසාන ශේෂය,

(1) ගැණුම් ගිණුමට හර කරයි (2) ණය හිමි ගිණුමට හර කරයි

(3) ගැණුම් ගිණුමට බැර කරයි (4) ණය හිමි ගිණුමට බැර කරයි

37) පහත ගණුදෙනු අතරින් වත්කම්, වගකීම් හා හිමිකම් යන සියල්ලම අඩුවන ගණුදෙනුව තෝරන්න.

(1) රු. 8,000 ක ගෙවල් කුලී ගෙවීම

(2) රු. 21,000 ක් ණය හිමියන්ට ගෙවීම

(3) රු. 15,000 ක භාණ්ඩ රු. 20,000ට විකිණීම

(4) රු. 20,000 ක බැංකු ණය වාරිකය ගෙවීම, එහි ඇතුලත් පොලිය රු. 2,000 කි.

38) කවිෂ්කගේ ව්‍යාපාරයේ 2022.01.01 දිනට හිමිකම රු. 360,000 කි. වර්ෂය තුල අමතර ප්‍රාග්ධනය ලෙස රු. 25,000ක් යොදවා ඇති අතර වර්ෂය තුල රු. 5,000 ක ගැනිලි සිදුකර ඇත. වර්ෂයේ උපයා ඇති ආදායම් රු. 720,000 කි. වර්ෂය තුල දරා ඇති වියදම් රු. 680,000 කි. 2022.12.31 දිනට ව්‍යාපාරයේ හිමිකම වන්නේ,

(1) රු. 340,000 කි. (2) රු. 380,000 කි. (3) රු. 420,000 කි. (4) රු. 425,000 කි.

39) පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසියක් නොවන්නේ,

(1) කාලීන දත්ත පහසුවෙන් ලබාගත හැකි වීම.

(2) ස්වයංක්‍රීයව නිමවන ගිණුම් වාර්තාවල නිරවද්‍යතාවය ඉහළ යාම.

(3) අවශ්‍ය ශ්‍රමය අවම වීම තුළින් මුදල් ඉතිරි වීම.

(4) පරිගණක දත්ත ලබාගැනීමේ හා වෙනස් කිරීමේ අවදානමක් තිබීම.

40) තිසරගේ ව්‍යාපාරයේ 2023.05.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 100,000 ක් වූ අතර බැර තීරුවේ එකතුව රු. 90,000 ක් විය. එහි වෙනස

(1) අවිනිශ්චිත ගිණුමට හර කල යුතුය. (2) ශේෂ පිරික්සුම හර කල යුතුය.

(3) ශේෂ පිරික්සුම නැවත එකතු කල යුතුය. (4) අවිනිශ්චිත ගිණුමට බැර කල යුතුය.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

# පළමු වාර පරීක්ෂණය - 2023

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II**

*සැලකිය යුතුයි*

**පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද,** II කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද** බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

01. පහත සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බ්ලොක් ගල් නිෂ්පාදන ආයතනයක අවුරුදු 05ක පමණ කාලයක් සේවය කිරීමෙන් ලත් පළපුරුද්දත් සමගම ලක්ෂිත සම්පත්ට තමාගේ ම එවැනි ව්‍යාපාරයක් ඇරඹීමේ අදහසක් මතු විය. 2023.01.01 දින ''ලකි බ්ලොක් ගල්'' යනුවෙන් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එදින එම ව්‍යාපාරය සඳහා ඔහු සතුව තිබූ රු. 900,000 ක් වටිනා ඉඩම සහ මුදලින් රු. 300,000 ක් යොදවන ලදී. තව ද 2023.01.05 දින රු. 200,000 ක් වැයකර යන්ත්‍ර උපකරණ මිල දී ගත් අතර ගල් සකස් කිරීමේ අච්චු සඳහා රු. 70,000 ක් වැය කරන ලදී. මෙම ව්‍යාපාරය සඳහා මනා පළපුරුද්දක් ඇති ඔහුගේ මිතුරෙකු වන ඔෂාන් සේවකයෙකු ලෙස බඳවා ගන්නා ලදී. 2023.01.05 දින රු. 50,000ක් තැන්පත් කර ව්‍යාපාරය නමින් මහජන බැංකුවේ ජංගම ගිණුමක් ආරම්භ කරන ලදී.

*2023 ජනවාරි මාසයේ සිදු වූ අනෙකුත් ගණුදෙනු පහත දැක්වේ.*

- 01/06 වැලි හා සිමෙන්ති මිල දී ගැනීම සඳහා චෙක්පතකින් රු. 40,000 ක් ගෙවන ලදී.
- 01/10 යන්ත්‍ර සඳහා ලිහිසි තෙල් මිල දී ගැනීමට වැය කළ මුදල රු. 6,000 කි.
- 01/12 ජල සැපයුම සඳහා ඉදුවර සමාගමින් රු. 80,000 ක විදුලි මෝටරයක් ණයට ගත්තා.
- 01/25 සේවක වැටුප රු. 25,000 ක් චෙක්පතකින් ගෙව්වා.

(i) (අ) නිෂ්පාදිතවල ස්වභාවය මත මෙම ව්‍යාපාරය කුමන නිෂ්පාදන ව්‍යාපාර වර්ගයක්ද ?

(ආ) ලක්ෂිත සම්පත්ගේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ii) (අ) ''ලකි බ්ලොක් ගල්'' ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද ?

(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ දැකිය හැකි වාසියක් හා අවාසියක් ලියන්න.

(iii) මෙම ව්‍යාපාරයට අනුව භාවිත කර ඇති නිෂ්පාදන සාධක වලට පහත වගුව අනුව නිදසුන බැගින් දෙන්න.

| ***නිෂ්පාදන සාධක*** | ***නිෂ්පාදන සාධක සඳහා නිදසුන්*** |
|---|---|
| භූමිය | |
| ශ්‍රමය | |
| ප්‍රාග්ධනය | |
| ව්‍යවසායකත්වය | |

(iv) (අ) මෙම සිද්ධියට අදාළ ශක්තීන් 02ක් ලියන්න.

(ආ) මෙම ව්‍යාපාරයට ඇල්මැති පාර්ශව 02ක් ලියන්න.

(v) මෙම ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කොපමණ ද ?

(vi) 2023.01.25 ගණුදෙනුවට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(vii) 2023.01.01 දිනට මෙම ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න.

(viii) 2023.01.12 දිනට මෙම ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනුව සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛණය හා මූලික සටහන් පොත ලියන්න.

(ix) මෙම ව්‍යාපාරයේ බැංකු ගිණුම පිළියෙල කර 2023.01.31 දිනට තුලනය කර දක්වන්න.

(x) මෙම ව්‍යාපාරයේ සිදු වී ඇති වත්කම් අඩුවීමට සහ වියදම් වැඩි වීමට අදාළ ගණුදෙනුවක් ලියා දක්වන්න.

**(ලකුණු 02x10 = 20 යි)**

**I කොටස - ව්‍යාපාර අධ්‍යයනය**
**(ප්‍රශ්න 02කට පමණක් පිළිතුරු සපයන්න)**

02.

(i) (අ) මිනිස් වුවමනාවක් යනු කුමක් ද ?

(ආ) අවශ්‍යතාවක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. **(ලකුණු 02 යි)**

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) තරඟකරුවෝ ව්‍යාපාර කෙරෙහි ඇල්ම දැක්වීමේ අරමුණක් ලෙස තම නිෂ්පාදිතවල මිල තීරණය කිරීම දැක්විය හැක.

(ආ) මිනිස් අවශ්‍යතා විවිධ වන අතර වුවමනා සීමිත වේ.

(ඉ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ව්‍යාපාර භාවිත කරන ස්වභාවික සම්පත් ප්‍රාග්ධනය ලෙස හඳුන්වයි.

(ඊ) සමූපකාර සමිති ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි. **(ලකුණු 02 යි)**

(iii) ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ මිල ඉහළ යාම නිසා ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් ආනයන වියදම ඉහළ ගොස් ඇත.

(අ) ඉහත ප්‍රකාශයෙන් ගම්‍ය වන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද ?

(ආ) ඛණිජ තෙල් භාවිතය අවම කිරීමට ආදේශකයක් යෝජනා කරන්න. **(ලකුණු 02 යි)**

(iv) (අ) රාජ්‍ය සංස්ථාවල ලක්ෂණ දෙකක් ලියන්න.

(ආ) රජයේ දෙපාර්තමේන්තුවල ලක්ෂණ දෙකක් ලියන්න. **(ලකුණු 02 යි)**

**(මුළු ලකුණු 08 යි)**

03.

(i) (අ) ව්‍යාපාර පරිමාණය අනුව වර්ග කිරීමේ දී භාවිත කරන ප්‍රමාණාත්මක නිර්නායක 02ක් ලියන්න.

(ආ) හවුල් ව්‍යාපාර ක්‍රමයේ වාසි 02ක් සඳහන් කරන්න. **(ලකුණු 02 යි)**

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර පොදු හා පෞද්ගලික ලෙස වර්ග කෙරේ.

(ආ) සි/ස සමාගමක කොටස්කරුවන්ගේ වගකීම ඔවුන් සමාගමේ ආයෝජනය කළ ප්‍රාග්ධනයට සීමා වේ.

(ඉ) සන්නිවේදන ක්‍රියාවලිය සම්පූර්ණ වීමට ප්‍රතිපෝෂණය අවශ්‍ය නැත.

(ඊ) කිසියම් රටක් වෙනත් රටකින් භාණ්ඩ තම රටට ගෙන්වීම අපනයන වෙළඳාම වේ.

**(ලකුණු 02 යි)**

(iii) (අ) චෙක්පතක් යනු කුමක් ද ?

(ආ) රක්ෂණ මූලධර්ම දෙකක් ලියන්න. **(ලකුණු 02 යි)**

(iv) (අ) මහාමාර්ග ප්‍රවාහනයේ වාසි දෙකක් ලියන්න.

(ආ) ගුවන් ප්‍රවාහනයේ වාසි දෙකක් ලියන්න. **(ලකුණු 02 යි)**

**(මුළු ලකුණු 08 යි)**

04.

(i) (අ) වෙළඳාම යනු කුමක් ද ?

(ආ) ව්‍යාපාර කටයුතු විධිමත්ව කරගෙන යාමට සහය වන උපකාරක සේවා දෙකක් ලියන්න. **(ලකුණු 02 යි)**

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) වාණිජ බැංකුවක සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක චෙක්පතක් තැන්පත් කල නොහැකිය.

(ආ) රක්ෂණයට සම්බන්ධ පාර්ශව අතරින් රක්ෂකයා ලෙස හඳුන්වන්නේ ආදාල රක්ෂණ සමාගමයි.

(ඉ) පාසල් සමූපකාරය විසින් පොත්පත් හා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සිල්ලර වෙළඳාමට අයත් වේ.

(ඊ) චෙක්පතක අණලදු සැමවිටම වාණිජ බැංකුවකි. **(ලකුණු 02 යි)**

(iii) කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන් නම් කරන්න. **(ලකුණු 02 යි)**

(iv) අලෙවිකරණය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 02 යි)**

**(මුළු ලකුණු 08 යි)**

## II කොටස - ගිණුම්කරණය
**(ප්‍රශ්න 02කට පමණක් පිළිතුරු සපයන්න)**

05.

(i) (අ) ගිණුම්කරණය යනු කුමක් ද ? **(ලකුණු 02 යි)**

(ආ) වත්කමක දැකිය හැකි ලක්ෂණ 02ක් ලියන්න. **(ලකුණු 02 යි)**

(ii) සඳුනිගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ මුල් සතිය තුළ සිදු වූ ගණුදෙනු පහත දැක්වේ.

2023.01.01 ප්‍රාග්ධනය ලෙස රු. 500,000 ක් මුදලින් යෙදවීම

2023.01.02 අත්පිට මුදලට ගැනුම් රු. 100,000

2023.01.03 බැංකුවෙන් ණයක් ගත්තා රු. 200,000

2023.01.05 අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 2,000 ක බඩු තොගයක් ව්‍යාපාරයෙන් ගත්තා

2023.01.07 සේවක වැටුප් ගෙව්වා රු. 5,000

ඉහත ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. ඒ සඳහා පහත ආකෘතිය භාවිතා කරන්න.

| ගණුදෙනු අංකය | වත්කම් (රු) = | හිමිකම් (රු) | + වගකීම් (රු) |
|---|---|---|---|
| 1 | + 500,000 (මුදල්) | + 500,000 (ප්‍රාග්ධනය) | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

**(ලකුණු 04 යි)**

(iii) චමත්කා ගිම්හානිගේ ව්‍යාපාරයේ 2023 පෙබරවාරි මාසයට අදාළ ගණුදෙනු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | ඉන්වොයිසියේ සඳහන් ශුද්ධ වටිනාකම (රු) |
|---|---|---|---|
| 2023.02.02 | 320 | සහන් | 10,000 |
| 2023.02.09 | 106 | සංජන | 12,000 |

***අවශ්‍ය වන්නේ,***

(අ) පෙබරවාරි මාසයට අදාළ ගැණුම් ජ'නලය පිළියෙල කිරීම

(ආ) අදාල ලේජර් ගිණුම් පිළියෙල කිරීම **(ලකුණු 04 යි)**

**(මුළු ලකුණු 12 යි)**

06)

(i) (අ) සුළු මුදල් වියදම් ප්‍රතිපූර්ණය කිරීම යනු කුමක් ද ? **(ලකුණු 02 යි)**

(ආ) පොදු ජ'නලයක තබන සටහන් වර්ග 2ක් දක්වන්න. **(ලකුණු 02 යි)**

(ii) අරෝෂ්ගේ ව්‍යාපාරයේ 2023 පෙබරවාරි මාසයේ පළමු දෙසතිය තුල සිදු වූ සුළු වියදම් පිළිබඳ තොරතුරු පහත දැක් වේ.

| දිනය | විස්තරය | මුදල (රු) |
|---|---|---|
| 2023.02.01 | අග්‍රිමය ලැබුණා | 2,000 |
| 2023.02.01 | ගමන් වියදම් | 160 |
| 2023.02.02 | ලිපිද්‍රව්‍ය වියදම් | 130 |
| 2023.02.03 | රුවන්ට ගෙව්වා | 150 |
| 2023.02.06 | සංග්‍රහ වියදම් | 165 |
| 2023.02.07 | කුලී රථ ගාස්තු | 150 |
| 2023.02.08 | කම්කරු කුලී | 150 |
| 2023.02.09 | පරිගණක උපකරණ | 500 |
| 2023.02.10 | කාබන් කොළ | 110 |
| 2023.02.11 | සංග්‍රහ වියදම් | 125 |
| 2023.02.13 | පරිත්‍යාග | 200 |
| 2023.02.14 | ලිපිද්‍රව්‍ය වියදම් | 130 |
| 2023.02.15 | අග්‍රිමය ප්‍රතිපූර්ණය කලා | |

*අවශ්‍ය වන්නේ,*

(අ) ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය වියදම්, සංග්‍රහ වියදම්, විවිධ වියදම් යන විශ්ලේෂණ තීරු භාවිතා කර 2023 පෙබරවාරි මාසයට අදාළ සුළු මුදල් පොත පිළියෙල කිරීම.

(ආ) අදාල ලේජර් ගිණුම්වල සටහන් ඇතුළත් කර පෙන්වීම. **(ලකුණු 06 යි)**

(iii) සංචලා විසින් පවත්වාගෙන යන සිල්ලර වෙළඳසලට 2023.02.10 වන දින සීමිත දේශාන් සමාගමෙන් රු. 30,000 ක් වටිනා ඉලෙක්ට්‍රොනික කිරුම් මිනුම් උපකරණයක් ණයට ගන්නා ලදී.

(අ) ඉහත ගණුදෙනුව සටහන් කිරීමට අදාළ මූලික සටහන් පොත පිළියෙල කර, එහි ඇතුළත් කළ සටහන් ලෙජර් ගිණුම්වලට පිටපත් කර පෙන්වන්න. **(ලකුණු 02 යි)**

**(මුළු ලකුණු 12 යි)**

07)

(i) (අ) අවිනිශ්චිත ගිණුම යනු කුමක් ද ? **(ලකුණු 02 යි)**

(ආ) පරිගණක ගිණුම්කරණයේ වාසි 02ක් ලියන්න. **(ලකුණු 02 යි)**

(ii) 2023 ජනවාරි 31 වන දිනට සිතුම්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 40,000ක් විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශණයේ සඳහන් වටිනාකම එයට වෙනස් විය. වෙනසට හේතු වශයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

- බැංකුව වෙත සෘජුවම ණයගැතියන් ප්‍රේෂණය කර තිබූ මුදල රු. 6,000 කි.
- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 7,000 කි.
- රු. 500 ක බැංකු ගාස්තුවක් බැංකුව අයකර ගෙන තිබිණි.
- නිකුත් කළ නමුත් මෙතෙක් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 5,000 කි.

*අවශ්‍ය වන්නේ,*

(අ) බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2023.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියල කර, එදිනට බැංකු ප්‍රකාශයේ පැවති ශේෂය පෙන්නුම් කිරීම. **(ලකුණු 06 යි)**

(iii) ප්‍රගීත්ගේ ව්‍යාපාරයේ 2023.01.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ එකතුව සමාන වුවත් ගිණුම් පරික්ෂා කිරීමේ දී පහත සඳහන් වැරදි අනාවරණය විය.

- රු. 5,000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත් වලින් සම්පූර්ණයෙන් ම මග හැරී තිබීම.
- රු. 20,000 ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජ'නලයේ සටහන් කර තිබුණේ රු. 2,000 ක් ලෙසය.

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් පොදු ජ'නලයේ ලියා දක්වන්න.

**(ලකුණු 02 යි)**

**(මුළු ලකුණු 12 යි)**